# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.01.29 පැය 1755 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/171/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**01. මනුෂ්‍ය ඝාතනයක් - නොරොච්චෝල පොලිස් වසම.**

2025.01.29 වන අද දින උදෑසන කාලයේ නොරොච්චෝල පොලිස් වසමේ මාම්පුරිය ප්‍රදේශයේ කාය වඩර්න මධ්‍යස්ථානයක් අසලදී පුද්ගලයෙකු විසින් කඩුවකින් පහර දී පුද්ගලයින් තිදෙනෙකුට තුවාල සිදු කර ඇති බවටත් තුවාලකරුවන් පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේදී එක් පුද්ගලයෙකු මිය ගොස් ඇති බවට නොරොච්චෝලය පොලිසියට ලද පණිවිඩයක් අනුව විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ මාම්පුරිය කොළණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඉහත කාය වඩර්න මධ්‍යස්ථානය තුල සිටි පුද්ගලයෙකු පුද්ගලික අමනාපයක් මත සිදු වූ බහින් බස්වීමක් මත මෙම පහරදීම සිදු කර ඇති බවට පොලිසිය සිදු කල වැඩිදුර විමශර්න වලදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධියට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර නොරොච්චෝල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. සම්භාහන මධ්‍යස්ථානයක් මුවාවෙන් පවත්වාගෙන ගිය ගණිකා නිවාස දෙකක් වටලා සැකකරුවෙකු සහ සැකකාරියන් තිදෙනෙකු අත්අඩංගුවට - මීගමුව කොට්ඨාස අපරාධ විමශර්න අංශය හා මීගමුව පොලිස් ස්ථානය.**

2025.01.28 වන දින රාත්‍රී කාලයේදී මීගමුව පොලිස් වසමේ කට්ටුව ප්‍රදේශයේදී මීගමුව කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් අනුව සම්භාහන මධ්‍යස්ථානයක් මුවාවෙන් පවත්වා ගෙන ගිය ගණිකා නිවාසයක් වටලා ගණිකා නිවාසය කළමණාකරනය කරන ලද සැකකරුවෙකු හා ගණිකා සේවයේ යෙදුනු සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වූ කොච්චිකඩේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරියන් අවුරුදු 24 හා 38 වයස් වල පසුවන මීගමුව හා ගල්ගමුව ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

2025.01.28 වන දින රාත්‍රී කාලයේදී මීගමුව පොලිස් වසමේ මීගමුව නගරයේදී මීගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් අනුව සම්භාහන මධ්‍යස්ථානයක් මුවාවෙන් පවත්වා ගෙන ගිය ගණිකා නිවාසයක්

වටලා ගණිකා සේවය සැපයීම සම්බන්ධයෙන් සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 52ක් වන කටුනායක ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මීගමුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**